# 6 ශීලය හා සමාජ සංවර්ධනය

පසුගිය වසරවල පාඩම් රැසකින් ම අපි බුද්ධදහමෙහි එන ශීලය පිළිබඳ බොහෝ කරුණු උගත්තෙමු. එසේ ම එම කරුණු තුළින් ජ උතුම් ශීල ශික්ෂාව පිළිබඳ පැහැදීමක් ද ඇති කරගත් අපි එය ප්‍රායෝගික ව ක්‍රියාවට නගන්නෝ වෙමු. ශීලය යනු කය, වචන සංවර කර ගනිමින් සිත දියුණු කර ගැන්මට මග සලසා ගනු පිණිස බුදුරජාණන් වහන්සේ වදළ පිළිවෙත යි. එ මගින් පුද්ගලයාගේ චරිතය ගොඩනගනු ලැබේ. සිල්වත් ව එසේ චරිතය දියුණු කරගත් මිනිසුන් සහිත වූ සමාජයක දැකගත හැකි සංවර්ධනය කෙබඳු දැ යි මෙ තැන් සිට අපි සාකච්ඡා කරමු.

සංවර්ධනය යනු දියුණුව යි. පුද්ගලයා හා සමාජය තුළ ද බාහිර වටපිටාව තුළ ද විවිධ අංශවලින් ඇති වන ප්‍රගතිය හෙවත් අභිවෘද්ධිය යි. සමාජයක සංවර්ධනය මූලික වශයෙන් ම දෙයාකාර ය. එනම් භෞතික සංවර්ධනය හා ආධ්‍යාත්මික සංවර්ධනය යි. මිනිසුන් අගහිඟකම් දුෂ්කරතා ආදියෙන් තොර වීම, මෙලොව සැපවත් ජීවිතයක් ගත කිරීමට අදාළ පෞද්ගලික හා සාමාජික වූ භෞතික අවශ්‍යතාවලින් වැඩි දියුණුවට පත් වීම භෞතික සංවර්ධනය යි. එය සංවර්ධනයේ එක් පැත්තකි. මිනිසුන් ගුණදහමින් වැඩි දියුණු වීම, තමාටත් සමාජයටත් අහිතකර වූ කායික වාචසික හා මානසික ක්‍රියාවන්ගෙන් වැළකී හිතකර වූ ක්‍රියාවන්ගෙන් යුක්ත වීම ආධ්‍යාත්මික සංවර්ධනය යි. බුදුදහම වෙසෙසින් ම එය අගය කරයි. ඒ සඳහා වඩාත් සවිස්තර ව ද උපදෙස් දෙයි. භෞතික සංවර්ධනය හා ආධ්‍යාත්මික සංවර්ධනය එකිනෙකට උපකාරී වන්නේ ය. ඒ දෙක වෙන් වෙන් ව පවත්වා ගත නො හැකි ය. බුදුරජාණන් වහන්සේ එම යථාර්ථය පිළිබඳ ව ද ගැඹුරු අවධානයක් ඇති දහමක් දේශනා කළහ.

ශීලය මෙහි දෙවනුව කී සදාචාරය පෙරටු කොට ගත් ආධ්‍යාත්මික සංවර්ධනය පිළිබිඹු කරයි. නොකළ යුතු දුසිරිත් නො කිරීම යහපත් ය. කළ යුතු සුසිරිත් කිරීම ද යහපත් ය. එබඳු යහපත් ක්‍රියාවන්ගෙන් තොර සමාජයක ආධ්‍යාත්මික සංවර්ධනයක් ඇති කර ගත නොහැකි ය. එසේ ම තිරසාර වූ විධිමත් භෞතික සංවර්ධනයක් ද අපේක්ෂා කළ නොහැකි ය. බුදුරදුන් විසින් අපට පෙන්වා දුන් පරිදි ගිහි බෞද්ධයාට අදාළ මූලික පිළිවෙත පඤ්චශීලය යි. නිත්‍ය ශීලය ලෙස ද ගේහසිත ශීලය ලෙස ද හැඳින්වෙන එය පුද්ගලයාගේ මෙන් ම සමාජයේ ද සංවර්ධනය පිළිබඳ අඩිතාලම ය. පදනම ය. එ මගින් ඇති වන සංවර්ධනය අපි ප්‍රධානතම පැතිකඩ කිහිපයක් යටතේ සාකච්ඡා කරමු.

## ශීලය හා සදාචාර සංවර්ධනය

මිනිසුන් සදාචාර සම්පන්න වීම ඔවුන්ගේ දියුණුව ප්‍රගතිය හෙවත් සංවර්ධනය පිළිබිඹු කරන්නේ ය. පෞද්ගලික හා සාමූහික වශයෙන් සිදු කරන දුරාචාර හේතුවෙන් මිනිස් සමාජය තුළ සිදුවන්නේ පරිහානියකි. මිනිස්කම හා සදාචාරය එකිනෙකට සම්බන්ධ ය. සදාචාරයෙන් තොර මිනිස් සමාජය සංවර්ධනය වී ඇතැ යි කිසිසේත් ම කිව හැකි නො වේ. එය සමාන වන්නේ තිරිසන් සතුන්ගේ සමාජයකට යි. තිරිසන්නු සදාචාරය මෙන් ම දුරාචාරය ද නො දනිති. මිනිසා තිරිසනාගෙන් වෙනස් වන්නේ අධර්මය මෙන් ම දුසිරිත ද ධර්මය මෙන් ම සුසිරිත ද නිවැරැදි ව තේරුම් ගැනීමට ඇති හැකියාව අනුව ය. එසේම අධර්මය, දුසිරිත බැහැරකොට ධර්මය, සුසිරිත අනුව කටයුතු කිරීමට ඇති නිපුණත්වය අනුව ය. ආහාර ගැනීම, නිද ගැනීම, බිය ඇති වීම හා සිය වර්ගයා බෝ කිරීම ද මිනිසුන්ට මෙන් ම තිරිසනුන්ට ද සාධාරණ ය. දුසිරිත් කිරීමට ලැජ්ජා භය නැති සමාජය තිරිසන් සමාජයක් වැනි ය. දෑස්, දෙකන්, අත් පා ආදිය ද මේ දෙපක්ෂයට ම ඇත. එහෙත් තිරිසන් සතුන් වෙත සදාචාර ගුණ ධර්ම නැත. ඒවා වර්ධනය කළ හැක්කේ මිනිසුන්ට පමණි. එබඳු සදාචාරාත්මක දියුණුවකින් තොර මිනිස් සමාජයක් තුළ මිනිස්කම ද නැත්තේ ය. සදාචාර සංවර්ධනයෙන් තොර වූ එහි අවශ්‍යතාව නො පිළිගන්නා සමාජයක් කෙතරම් භෞතික සම්පත් ඇතත්, සංවර්ධනය වී නොමැත. බුදුරජාණන් වහන්සේ විසින් මේ මානව සමාජය සිව් ආකාරයැ යි දේශනා කොට තිබේ.

1. තිරිසතුන් සේ සිටින මිනිස්සු
2. ප්‍රේතයින් සේ සිටින මිනිස්සු
3. තිරිසනුන් සේ සිටින මිනිස්සු
4. මිනිසුන් සේ සිටින මිනිස්සු

මෙහි පළමු, දෙවන හා තෙවන ගණවලට අයත්වන්නේ මිනිස් ප්‍රතිරූපකයෝ ය. මිනිසුන් ව ඉපිද සිටිය ද මිනිස්කම නැත්තෝ ය. බුදුදහම උතුම් කොට සලකන්නේ සිවුවෙනි වර්ගයට අයත් සැබෑ මිනිස් ගුණ ඇති සදාචාරවත් මිනිසුන් පමණි. ඔවුහු දියුණුවට සංවර්ධනයට පත්වූවෝ ය. ආලෝකයෙන් ආලෝකයට යන්නෝ ය. දුසිරිත් කිරීමට ලැජ්ජාවක් නැති, ගුණ දම් නො සලකන, අන් අය නොමග යවන, දැහැමි තැන්පත් ගති පැවතුම් නැති, අධර්මයෙන් උපයා යැපෙන තැනැත්තා සුවසේ කා බී වසන දක්ෂ කපුටකු වැනි ය යනු ධම්මපද දේශනාවෙකි. එ බන්දන් ඇති සමාජය සංවර්ධනය වී ඇතැ යි කිව නොහැකි ය.

පරපණ නසන්නවුන්, හිංසා කරන්නවුන්, නුදුන් දේ ගන්නා සොරුන්, අසම්මත ස්ත්‍රී පුරුෂ සබඳතා ඇත්තවුන්, අනුන් රවටන මුසා බස් කියන්නවුන් හා මත්වතුර මත්ද්‍රව්‍ය භාවිතයෙන් විකෘති වූවන් ද ඇති සමාජයක් කෙසේ නම් දියුණු යැයි කිව හැකි ද? එය එක්තරා ම්ලේච්ඡ සමාජයකි.

සදාචාර සංවර්ධනයකින් තොර ව මිනිස්කම දියුණු කළ නොහැකි ය. මිනිස්කම නොමැති ව ඇතිකර ගන්නා භෞතික සංවර්ධනය මායාවකි. එය සුරක්ෂිත නො වේ. එයින් ලබන සතුට ද අශිෂ්ට වූ සතුටකි.

## ශීලය හා මානසික සංවර්ධනය

බුදුදහම අනුව සියලු මානව ක්‍රියාකාරකම්වලට මනස ම පෙරටු ය. දෙටු ය. පව්ටු, නොදියුණු මනස මුල්කොට ගත් කියුම් කෙරුම් නිසා මිනිසා පසුපස දුක් පීඩාවන් ම ඇදී එයි. එසේ දුක අසහනය රජ කරන මිනිසුන්ගේ සමාජය සංවර්ධනයට පත්ව ඇතැයි කිව නොහැකි ය. එය පිරිහුණු සමාජයකි. එසේ ම දියුණු මනස මුල් කොට ගත් කියුම් කෙරුම් නිසා මිනිසා පසුපස එන්නේ සැපත යි, සතුට යි. සංවර්ධනය වී ඇතැයි කිව හැක්කේ එසේ සැපවත් ව තුටු පහටුව සිටින මිනිසුන් ගේ සමාජය යි. එසේ කායික හා වාචසික වශයෙන් පිරිහීම දුසිල් බව ද, දියුණු වීම සුසිල් බව ද ප්‍රකට කරන්නේ ය. එය සංවර්ධනයෙහි පදනම යි.

බුදුරදුන් වදාළ ශීලය චාරිත්‍ර ශීලය හා වාරිත්‍ර ශීලය යැ යි දෙයාකාර වේ. එහි ඇත්තේ විරමණය හෙවත් විරතිය පමණක් නො වේ. නොකළ යුත්ත පාපයයි. අකුසලයයි. එය නොකිරීම, ඉන් දුරු වීම විරමණයයි. සමාදානය හෙවත් සිරිත ද ශීලයෙහි ඇතුළත් ය. කළයුත්ත පිනයි. කුසලයයි. එය කිරීම එහි යෙදීම සමාදානය යි. බුදුරජාණන් වහන්සේ වදාළ පරිදි එකිනෙකට උපකාරී වූ මෙකී සිරිත ද විරිත ද සමබර ව ඇති සමාජය සංවර්ධනය වූවකි. ශීලය තේරුම් කළ උන්වහන්සේ පරපණ නැසීමෙන් වැළකීම, එය අත් හැරීම, පරහිංසනයෙහි නොයෙදීම යන විරිත මෙන් ම පරපණට ගරු කිරීම, සියලු සතුන් වෙත කරුණා මෛත්‍රී සහගත වීම යන සිරිත ද එහි ඇතුළත් කළහ. මෙහි ප්‍රාණඝාතයෙන් වළකින්නා ක්‍රියාවෙන් සංවර්ධනය වෙයි. සතුන් වෙත මෙත් කරුණාව ද ඇති බැවින් ඔහු මනසින් ද සංවර්ධනය වූවෙකි. නුදුන් දේ ගැනීමෙන් වැළකීම, සොරකම අත් හැරීම යනු විරමණයයි. විරිතයි. ඒ සමග ම දුන් දේ ගැනීම කැමති වීම ද සොර සිතින් තොර වීම ද උගන්වා තිබේ. එය සමාදානයයි. සොරකමින් වළකින්නා ක්‍රියාවෙන් සංවර්ධිත ය. සොර සිත නැති බැවින් ඔහු මනසින් ද සංවර්ධිත ය. මෙලෙසින් ම අශිෂ්ට, අසම්මත ස්ත්‍රී පුරුෂ සබඳතාවලින් වැළකීමෙන් විරතිය සම්පූර්ණ වේ. ඒ සමග ම ගිහියකු වශයෙන් ශිෂ්ට, සම්මත වූ ස්ත්‍රී පුරුෂ සබඳතා ඇති, අන් පුරුෂයන් අන් අඹුවන් කෙරේ යොමු කළ රාග සිත් නැති විය යුතු ය. අනුන් රැවටීමෙන් මුසාවෙන් වැළකීමෙන් විරිත සපිරෙයි. සිරිත සපිරෙනුයේ පිළිගත හැකි වචන එනම් ඇත්ත කීමෙනි. පිරිසිදු සිතින් කථා කිරීමෙනි. මත්වතුර මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකීම මගින් විකෘතිය ද ප්‍රමාදය ද වැළකෙයි. මනා සිහි නුවණින් හැසිරීම මගින් ප්‍රකෘතිය ද අප්‍රමාදය ද වැඩේ. යහපත් සිත් ඇත්තෙක් වෙයි. මෙසේ ශීලයෙහි විරතිය සමාදානය මගින් කායික හා මානසික සංවර්ධනය සිදුවන්නේ ය.

සිතින් මනසින් එසේ සංවර නොවූ පවිටු සිත් ඇති කයින් හා වචනයෙන් පමණක් එනම් බාහිර වශයෙන් පමණක් සංවර වූ තැනැත්තා ''පිටතින් පමණක් රන් පැහැය ආලේප කළ, එහෙත් මැටිටෙන් තැනූ ව්‍යාජ වංචනික කුණ්ඩලාභරණයක් වැනි යැ යි'' බුදුරජාණන් වහන්සේ වදාළහ. එබන්දන් හැඳින්වෙනුයේ කුහකයන් ලෙසයි.

භාවනාව යනු සිත් සතන්හි අකුසල් දහම් යටපත් කොට, කුසල් දහම් වැඩීම ය. එය මානසික සංවර්ධනය පිණිස බුදුරදුන් වදළ පිළිවෙත යි. ඒ සඳහා ශීලය ම පදනම වේ. සීලයෙන් හා භාවනාවෙන් තුන්දෙර නො වැඩූ මිනිසුන් ඇති සමාජය තුළ සතුට සැපත නො රඳයි. එය අසංවර්ධිත සමාජයකි.

## ශීලය හා මානව සබඳතා සංවර්ධනය

මිනිසාගේ මූලික අයිතීන් සුරක්ෂිත නො වන, සාමය ද මිනිස් සබඳතාවන් ද පිරිහී ගිය සමාජයක දියුණුවක් හෙවත් සංවර්ධනයක් ඇතැ යි කිව නොහැකි ය. බුද්ධදහම ඒ සියල්ල අගය කරන එ මගින් තහවුරු කෙරෙන තිරසර සමාජ සංවර්ධනයකට මග පෙන්වන අගනා උපදෙස් රැසකින් සමන්විත ය. පන්සිල් රැකීම ඉන් එකකි. පන්සිල් රකින්නා මිනිස් අයිතියට ගරු කරයි. මිනිස් සබඳතා ගොඩනගයි. එය සාමය ද සහජීවනය ද ඇතිකර ගැනීමට වෙසෙසින් ම මහෝපකාරී ය.

අපට සංවර්ධනය, දියුණුව වෙත ළඟා වීමට නම් නිසැක ව ම ජීවිතාරක්ෂාව අවශ්‍ය ය. එකිනෙකා වනසන එකිනෙකාට හිංසා පීඩා කරන සමාජයක ජීවත්වීමේ අයිතියට හානි සිදු වෙයි. එ මගින් වැඩි දියුණු වන්නේ සාමය නොව ගැටුම් ය. කලකෝලාහලය, මානව සබඳතාවන්ගේ ධාර්මික සැකැස්ම එයින් බිඳ වැටේ. බිය සැක දෙකින් තොර නිදහස් සහනදායී සමාජයක් එ මගින් බිහි වන්නේ නැත. එසේ ම මිනිසුන් එකිනෙකාට වෙන් වෙන් ව අයත් වන දේපළ සම්පත් මෙන් ම සියල්ලන් ම පොදු වේ උරුමකම් කියන දේපළ සම්පත් ද ඇත. එම සම්පත්වල පෞද්ගලික හා පොදු අයිතිය ද සමාජයක් තුළ සහතික විය යුතු ය. එය සිදුවන්නේ සොරකමින් වැළකුණු මිනිසුන් ඇති සමාජයක යි. එසේ නො වන සොරකම පැතිරගිය සමාජයක ද සාමයක් නැත. මානව සබඳතා බිඳ වැටෙයි. නිදහස් දේපළ අයිතිය අහිමි වෙයි. දේපළ රැකෙන්නේ ද සංවර්ධනය කළ හැක්කේ ද එහි අයිතිය සුරක්ෂිත වූ විට යි.

එසේ ම මිනිසුන් වශයෙන් ශිෂ්ට සම්මත ලෙස ස්ත්‍රී පුරුෂ සබඳතා පැවැත්වීම හෙවත් කාම මිථ්‍යාචාරයෙන් වැළකී ශීලාචාර අඹු සැමි ජීවිත ගත කිරීම ද සමාජ සංවර්ධනය උදෙසා අත්‍යවශ්‍ය කරුණකි. තිරිසන් සමාජය තුළ එවන් පිළිගැන්මක් හෝ පැවැත්මක් නැත. එබැවින් ම ඔවුහු අසම්මත හා අශිෂ්ට සබඳතා පවත්වති. විධිමත් පවුල් ඒකකයක් බිහි කර ගැන්මටත් සාමයෙන් හා සතුටින් කල් ගෙවන්නටත් තිරිසන්නු අසමත් ව සිටිති.

ඔවුනට උපදින දූ පුත්තු ද වැඩි දියුණුවකින් තොර ව පහත් පිරිහී ගිය ජීවිත ගත කරති. සමාජයක සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය වන, එසේ ම නොයෙක් අයුරින් මහෝපකාරී වන අන්‍යෝන්‍ය වශයෙන් අදහස් හුවමාරු කර ගැන්මට යොදා ගැනෙන වචන පිළිගත හැකි වීම ද ඉතා වැදගත් කරුණකි. එකිනෙකා නොමග යවන, රවටන වචන භාවිතයෙහි නිරත වන්නවුන් ඇති සමාජයක පිරිහීමක් මිස වැඩි දියුණුවක් ඇති නො වේ. විවිධ ගැටලු ඇති කරන මුසාවෙන් බොරුවෙන් වැළකී සත්‍යවාදී වීම, එ නම් ඇත්ත කථා කිරීම සාමයට හා සංවර්ධනයට තුඩු දෙයි. මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතය ද නොයෙක් අයුරින් සමාජ සංවර්ධනයට හානිකර වෙයි. එයින් මිනිස්සු විකෘති සිත් ඇති, විකෘති හැසිරීම් ඇති, විකෘති බස් ඇති එක්තරා උමතු පිරිසක් වෙති. එසේ ම කායික වශයෙන් ද බලවත් සේ රෝගී වෙති. ධනය වැනසෙයි. කලිකලහ හට ගනී. සාමය ද දියුණුව ද බිඳ වැටේ. දිනෙන් දින දියුණු වන අවුල් වියවුල් ද අසමගිය ද රජ කරයි.

අපට එකමුතු ව ජීවත්විය හැක්කේ ද එමගින් මානව සමාජ සබඳතා ගොඩනගා ගත හැක්කේ ද පන්සිල් රක්නා මිනිසුන්ගේ සමාජයක ය.

## ශීලය හා ආර්ථික සංවර්ධනය

ආර්ථික සංවර්ධනය යන්නෙන් අද බොහෝ විට අදහස් කෙරෙන්නේ භෞතික සම්පත් හා පහසුකම් වඩා වවා ගැන්ම ය. එ නම් සමාජයෙහි මිනිසුන් ආහාර පාන ඇඳුම් පැළඳුම් නිවාස වැනි අවශ්‍යතාවලින් සම්පූර්ණ වීම ය. එසේ ම මංමාවත්, ජලය, විදුලිය වැනි පහසුකම් ඇතිවීම ය. බුදුදහම එම ආර්ථික සංවර්ධනය අවම කොට නො සලකයි. භෞතික අවශ්‍යතා සපුරා ගත හැකි එ බඳු සංවර්ධනයක් තුළින් සැපවත් ජීවිත ගත කරන මානව සමාජයක් ගොඩ නගා ගැන්මට අදාළ ඉතා වැදගත් ප්‍රායෝගික උපදෙස් රැසක් බුදුදහමෙහි ඇතුළත් ය. දිළිඳුකම ගිහියාට මහ දුකක් බව බුදුරදුන් දේශනා කර ඇත. එය ජය ගැන්මට පුද්ගලයකු කෙසේ කටයුතු කළ යුතු ද රජය කෙසේ ක්‍රියා කළ යුතු දැ යි නොයෙක් විට නොයෙක් අයුරින් පැහැදිලි කොට තිබේ.

එහෙත් එබඳු දියුණුවීමක් පමණක් ම ප්‍රමාණවත් යැයි සලකාගෙන කා බී ජීවත් වීම ම එක ම අරමුණ ලෙස පිළිගැන්ම නිසා ආධ්‍යාත්මික හා සදාචාරාත්මක සංවර්ධනය බිඳ වැටෙයි. පස්පවින් වැළකීම අතුළු සාරධර්ම ගරු නොකරන සමාජයක් ඇති වෙයි. බුදුදහම පෙන්වා දෙන්නේ සාරධර්මවලින් බැහැර ව කා බී සැපෙන් ජීවත් වීම පමණක් ම සැබෑ සමාජ සංවර්ධනය නොවන බවයි.

ලෝවැඩ සඟරාව ලියූ **වීදගම මාහිමියෝ** එසේ සාරධර්ම සංවර්ධනයකින් තොර ව හුදෙක් කා බී ජීවත්වීම ම උතුම් යැයි සිතන මිනිසුන් ගැන මෙ සේ පැවසූහ.

| | |
|---|---|
| කාලා රසමුසු බෝජන | කර පෙම් |
| ගාලා සුවඳැති සඳුනුත් | මනරම් |
| ලාලා අබරණ නිසිලෙස | සැරහුම් |
| පාලා ගිය වැනි බහුරූ | කෝලම් |

දිව පිනවන රසවත් දේ කමින්, නොයෙක් දේට ඇලුම් කරමින්, සිත් අලවන සුවඳ සඳුන් ගාමින්, ආභරණ ආයිත්තම් පැළඳ සැර හී ජීවත් ව මිය ගිය විට බහුරූ කෝලමක් පෙන්වා ගියා වැනි ය. පන්සිල් නොරකින එ බඳු සමාජයක භෞතික සම්පත් ද තාවකාලික ය. ඒ දියුණුව බිඳ වැටෙයි. එවිට සැපවත් දිවියක් නැත. මේ අනුව සීලයත් සමාජ සංවර්ධනයත් එකිනෙකට උපකාරී ය. ඉන් එකක් පමණක් ඇති ව සමාජයකට සංවර්ධනය විය නොහැකි ය.

## සාරාංශය

සංවර්ධනය යනු දියුණුව යි. එය භෞතික හා ආධ්‍යාත්මික යැ යි දෙයාකාර ය. ඒ දෙක එකිනෙකට උපකාරී වේ. ජීවිතාරක්ෂාව, දේපළවල ආරක්ෂාව, ශිෂ්ට සම්මත පවුල් ජීවිතය, රැවටිලිවලින් තොරවීම හා විකෘති වූවන්ගේ පීඩාවලින් ආරක්ෂාවීම ද මගින් සාමය සහජීවනය හා දියුණුව ද ළඟාකර ගැනීමට පඤ්චශීලය රක්නා සමාජයක මිනිසුන්ට හැකි වෙයි. කා බී ජීවත් වීම ම දියුණුව නො වේ. සාරධර්ම වලින් තොර ව එසේ ජීවත් වීම මිනිසත්බවට නො ගැළපෙයි. එය පටු අපේක්ෂාවකි. එ බැවින් සාරධර්ම සංවර්ධනය මානසික සංවර්ධනය හා බුද්ධිමය සංවර්ධනය ද සමාජයක තිබිය යුතු ය. භෞතික සංවර්ධනය ඵලදායක වන්නේ ද එවිට යි.

## ක්‍රියාකාරකම්

01. භෞතික හා ආධ්‍යාත්මික සංවර්ධනය වෙන් වෙන් ව හඳුන්වන්න.

02. පන්සිල් රැකීමෙන් තහවුරු වන මානව අයිතිවාසිකම් පහ නම් කරන්න.

03. මිනිසාත් තිරිසනාත් අතර ඇති වෙනස දක්වෙන වාක්‍ය පහක් ලියන්න.

## පැවරුම

01. නූතන සමාජයේ සාරධර්ම බිඳ වැටීමට හේතු පිළිබඳ ව කණ්ඩායම් සාකච්ඡාවක් සිදුකර ඒ ඇසුරෙන් වාර්තාවක් සම්පාදනය කරන්න.

තමන් පණ ලෙස හැම
සතුන් ගැන සලකා පෙම
ඔවුන් දුටු විගසම
කරන් ආදර ගුණය නොහැරම

සිරිත් මල්දම